AL/2019/52-S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07 / 0830 - 1030

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ......................................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 13 | |
| 03 | 14 - 23 | |
| 04 | 24 - 35 | |
| 05 | 36 - 42 | |
| 06 | 43 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අධි/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**

※ ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
※ එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

1. 'මංගලම්' නර්තනයට අදාළ මූලික බෙරපදය වන්නේ,
   (1) ගත් දිත් තත් දොම් තකු දොම්
   (2) දොං තකු දං ගජිංත
   (3) දොං තකු දොං ජිං තක තරිකිට
   (4) කුං දිත් තත් දොං තක තරිකිට
   (5) දොංතකු දොංතකු දොංජිං ගත් තත් ජිං තරිකිට (.........)

2. කෝලාට්ටම්, සුලකු සහ වෙම්බු යන ද්‍රවිඩ ගැමි නැටුම්වලට සමාන සිංහල ගැමි නැටුම් ලෙස සැලකෙන්නේ,
   (1) ලී කෙළි, කුලු සහ කළගෙඩි නැටුම් ය.
   (2) ලී කෙළි, කුලු සහ සවරම් නැටුම් ය.
   (3) කුලු , කළගෙඩි සහ මෝල්ගස් නැටුම් ය.
   (4) කුලු , සවරම් සහ පතුරු නැටුම් ය.
   (5) ගොයම් කැපීම, සවරම් සහ තාලම් නැටුම් ය. (.........)

3. "දොංත ගතම් දොංත ගතිගතම්...." යන පදයෙන් සභාවට පිවිසෙන කෝලම් චරිතය වන්නේ,
   (1) මුදලි ය. (2) අණ බෙරකරු ය. (3) ජසයා ය.
   (4) ලෙන්චිනා ය. (5) නොංචි ය. (.........)

4. "වල් විදුනා රැගෙන ගෙනා හිමි ගිණිකොණ වැඩ සිටිනා"
මෙම බලි කවි පාදයෙහි දැක්වෙන '**වල් විදුනාව**' යනුවෙන් හඳුන්වන්නේ,
(1) අත්මිණිය ය. (2) විජිනිය ය. (3) ඊතලය ය. (4) පන්දම ය. (5) උඩැක්කිය ය. (………)

5. කරුණ, භයානක සහ බීභත්ස්‍ය යන රසයන්ගෙන් නිෂ්පන්න වන භාවයන් වන්නේ,
(1) භය, ශෝක සහ උත්සාහයයි. (2) භය, ශෝක සහ විස්මයයි.
(3) ශෝක, භය සහ ජුගුප්සාවයි. (4) ශෝක, භය සහ හාස්‍යයයි.
(5) ශෝක, භය සහ රතියයි. (………)

6. අනුරාධපුර කුට්ටම් පොකුණ අසලින් ලැබුණු ලෝකඩ රූපයෙන් පිළිබිඹු වන්නේ,
(1) නිළියන් සහ නළුවන්ගේ රූප පෙළකි.
(2) බෙර වාදකයකුගේ රූපයකි.
(3) භ්‍රමණය වන නළඟනකගේ නර්තන විලාසයකි.
(4) වීණා වාදකයින් සහ තාලම්පට වයන රූපයකි.
(5) නටන ස්ත්‍රියක සහ පුරුෂයකුගේ විලාසයකි. (………)

7. රීරි යකාගේ වස්ත්‍රය සහ වෙස්මුහුණ සඳහා භාවිත කෙරෙන වර්ණය වන්නේ,
(1) සුදු වර්ණයයි. (2) නිල් වර්ණයයි.
(3) කහ වර්ණයයි. (4) රතු වර්ණයයි.
(5) කොළ වර්ණයයි. (………)

8. උඩරට, පහතරට සහ සබරගමු ශාන්තිකර්මවලට අයත් නාට්‍යමය පෙළපාළි අවස්ථා පිළිවෙළින්,
(1) ඌරා යක්කම, නානුමුරය සහ පොත්කඩේ යක්කම වේ.
(2) ඌරා යක්කම, කෝල්මුරය සහ අසුර යක්කම වේ.
(3) නයා යක්කම, පොත්කඩේ යක්කම සහ දර්ශන යක්කම වේ.
(4) ආවැන්දුම, නානුමුරය සහ දළුමුර පාළිය වේ.
(5) ගුරුගෙම්මාලාව, නානුමුරය සහ දේවකෝල්පාඩුව වේ. (………)

9. පහත දැක්වෙන වරණ අතුරෙන් **වරම්** කවියක් ලෙස සැලකිය හැකි කවි පාදය කුමක් ද?
(1) ඇත සිට පෙරුමන් පුරාගෙන .... (2) ආලවඩන ගන්ධ කුටියේ ....
(3) අනේ මී මැස්සේ මල් රොන් .... (4) මම සිරස මුනින්දා බුද්ධ රාජං ....
(5) සිහින් සිනිඳු සළුව පැළඳ .... (………)

10. සබරගමු සහ පහතරට නර්තන සම්ප්‍රදායන්ට අයත් නර්තන අංග පිළිවෙළින්,
(1) ගමන් මාත්‍රය සහ මුල් මාත්‍රය වේ. (2) ගමන් මාත්‍රය සහ තිත් මාත්‍රය වේ.
(3) ශුද්ධ මාත්‍රය සහ සින්දු මාත්‍රය වේ. (4) පට්ටුතල් මාත්‍රය සහ මුල් මාත්‍රය වේ.
(5) පට්ටුතල් මාත්‍රය සහ ශුද්ධ මාත්‍රය වේ. (………)

11. අඬ ඉර, බොකු හම් සහ ගැටිය යොදාගනු ලබන්නේ පිළිවෙළින්,
(1) ගැට බෙරය, පහතරට බෙරය සහ බුම්මැඩිය සඳහා ය.
(2) ගැට බෙරය, පහතරට බෙරය සහ දවුල සඳහා ය.
(3) ගැට බෙරය, රබාන සහ දවුල සඳහා ය.
(4) උඩැක්කිය, තම්මැට්ටම සහ දවුල සඳහා ය.
(5) උඩැක්කිය, රබාන සහ තම්මැට්ටම සඳහා ය. (………)

12. 'රූ රැසේ අඳිනා ලෙසේ අත් ළෙල දිදී විදුලිය පබා .....' යන කවිය සඳහන් වන්නේ,
(1) ගම්පළ යුගයට අයත් තිසර සංදේශයේ ය.
(2) ගම්පළ යුගයට අයත් මයුර සංදේශයේ ය.
(3) කෝට්ටේ යුගයට අයත් සැළලිහිණි සංදේශයේ ය.
(4) කෝට්ටේ යුගයට අයත් ගුත්තිල කාව්‍යයේ ය.
(5) කෝට්ටේ යුගයට අයත් පරෙවි සංදේශයේ ය. (………)

13. පාසල් අධ්‍යාපනයේ නර්තන විෂය සම්බන්ධ ව පත් වූ ප්‍රථම අධ්‍යක්ෂවරයා වන්නේ,
(1) ඇස්. පණිභාරත ය. (2) ඩබ්ලිව්. බී. මකුලොලුව ය.
(3) එස්. එල්. බී. කපුකොටුවේ ය. (4) ජේ. ඊ. සේදරමන් ය.
(5) ශ්‍රී ජයනා රාජපක්ෂ ය. (………)

**14.** 'උනුනුපියන' යනුවෙන් හඳුන්වන්නේ,
(1) කපුයක්කාරියෙහි භාවිත කපුයන්තරයයි. (2) කපුයක්කාරියෙහි භාවිත නානුමුර වට්ටියයි.
(3) සන්නියකුමේ භාවිත පිදවිලි වට්ටියයි. (4) නානුමුරයේ දී භාවිත වට්ටියෙහි පියනයි.
(5) නානුමුරයෙහි භාවිත නානුමුර වට්ටියයි. (………)

**15.** 'සිරිවසගෙන අසු නැගෙමින් නොලෙසා ....' මෙම කවියෙන් කියැවෙන්නේ කුමන ග්‍රහයා පිළිබඳව ද?
(1) කුජ ග්‍රහයා (2) රවි ග්‍රහයා (3) සිකුරු ග්‍රහයා
(4) බුද ග්‍රහයා (5) ශනි ග්‍රහයා (………)

**16.** කෝලම් නාටකයේ එන ජස කෝලම හා සම්බන්ධ වන අනෙකුත් චරිත වන්නේ,
(1) ලෙන්චිනා, පුරන්සිනා සහ මුදලි ය. (2) ලෙන්චිනා, නොංචි සහ මුදලි ය.
(3) ලෙන්චිනා, අණබෙර සහ චුක්කිතියා ය. (4) පුරන්සිනා, අණබෙර සහ ඩිංගුරුවා ය.
(5) අණබෙර, හෙන්චප්පු සහ හේවාරාළ ය. (………)

**17.** කොහොඹා යක් කංකාරියේ දී වාදන ශිල්පියාගේ කුසලතාව වඩාත් ඉස්මතු වන්නේ,
(1) ආවැන්දුම සහ මඟුල් බෙර වාදනයේ දී ය. (2) යක්ඇනුම සහ මඟුල් බෙර වාදනයේ දී ය.
(3) යක්ඇනුම සහ අත්‍යා බෙර වාදනයේ දී ය. (4) යක් තුන්පදය සහ අත්‍යා බෙර වාදනයේ දී ය.
(5) යක් තුන්පදය සහ පිං බෙර වාදනයේ දී ය. (………)

**18.** '**ගවරමලට**' විශේෂ ස්ථානයක් හිමිවන ශාන්තිකර්මය වන්නේ,
(1) කඩවර කංකාරියයි. (2) වලියක් මංගල්‍යයයි.
(3) කිරි ඉතිරුම් මංගල්‍යයයි. (4) කොහොඹා යක් කංකාරියයි.
(5) මුට්ටි මංගල්‍යයයි. (………)

**19.** සූවිසි විවරණ කවි පාදය ඇතුළත් වරණය කුමක් ද?
(1) ආලවඩන ගන්ධ කුටියේ මුනි වැඩ සිටගෙන ......
(2) බුද්ධං සරණේ සිරස දරාගෙන .....
(3) ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ ........
(4) වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම් ......
(5) වේවා බෝසත් සිරි ජයමංගල ...... (………)

**20.** සාම්ප්‍රදායික බලි රූපයක් වර්ණ ගැන්වීම සඳහා යොදාගනු ලබන්නේ,
(1) ගස්වල පොතු, කිරි මැටි සහ තේ කොළ ය.
(2) ගස්වල පොතු, බුලත් විට සහ ඇලි ය.
(3) ශාක පත්‍ර යුෂ, ගඩොල් කුඩු සහ පැන්සෝක් ය.
(4) ශාක පත්‍ර යුෂ, ඇලි සහ පවුඩර් ය.
(5) ශාක පත්‍ර යුෂ, ඇලි සහ අඹරාගත් කහ ය. (………)

**21.** කථක් නර්තනය සඳහා භාවිත වාද්‍ය භාණ්ඩ වන්නේ,
(1) පඛාවජ්, මද්දල සහ හාර්මෝනියම් වේ.
(2) පඛාවජ්, තබ්ලාව සහ හාර්මෝනියම් වේ.
(3) වෙන්ඩාව, මෘදංගම් සහ කෝල් බෙරය වේ.
(4) වෙන්ඩාව, පඛාවජ් සහ වීණාව වේ.
(5) වෙන්ඩාව, තබ්ලාව සහ වයලීනය වේ. (………)

**22.** මාත්‍රා $2 + 4$ තාල රූපයට සමාන වන කර්ණාටක තාලය වන්නේ,
(1) රූපක තාලයයි. (2) ආදි තාලයයි.
(3) මිශ්‍ර චාපු තාලයයි. (4) ඛණ්ඩ චාපු තාලයයි.
(5) තිශ්‍ර චාපු තාලයයි. (………)

**23.** රංග වින්‍යාසයේ මූලික සංකල්පයක් වන චලනයෙහි ස්වභාවය වෙනස් වීම කෙරෙහි බලපාන සාධක වන්නේ,
(1) කාලය, වේගය, දුර සහ අවකාශය වේ.
(2) තාලය, අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වේ.
(3) ශක්තිය, කාලය, හැඩතල සහ ප්‍රත්‍යාංග වේ.
(4) ශක්තිය, කාලය, වේගය සහ දුර වේ.
(5) ශක්තිය, කාලය, වේගය සහ හැඩතල වේ. (………)




EXAMMOOD.LK
EXAMMOOD.LK


**24.** මන්තිරි වන්නම, මහබෝ වන්නම සහ නළඟන වන්නම යන නවතම වන්නම් රචනය කර ඇත්තේ පිළිවෙළින්,
(1) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ආරියරත්න කළුආරච්චි ය.
(2) මුදියන්සේ දිසානායක, ඩබ්ලිව්. ඩී. අමරදේව සහ ජයසේන කෝට්ටේගොඩ ය.
(3) ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ ප්‍රේමකුමාර එපිටවෙල ය.
(4) ආරියරත්න කළුආරච්චි, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සහ මුදියන්සේ දිසානායක ය.
(5) මුදියන්සේ දිසානායක, ඇස්. පණිභාරත සහ ආරියරත්න කළුආරච්චි ය. (………)

**25.**


A



B



C



ඉහත A, B සහ C රූපවලින් දක්වා ඇත්තේ පිළිවෙළින්,
(1) පහන් පැළ, ගොප් ගෙඩිය සහ සුනියම් වීදිය වේ.
(2) පහන් පැළ, ගොප් ගෙඩිය සහ කිරිමැස්ස වේ.
(3) පහන් පැළ, ගොප් ගෙඩිය සහ යහන වේ.
(4) ගොටුව, ගොප් ගෙඩිය සහ තොරණ වේ.
(5) ගොටුව, ගොප් ගෙඩිය සහ යහන වේ. (………)

● අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

**26.** සංඛපාල රජු හා සම්බන්ධ කතා පුවත අයත් වන්නේ…………………………………… ශාන්තිකර්මයට ය.

**27.** නාට්‍ය ශාස්ත්‍රයේ දැක්වෙන පරිදි රස නිෂ්පත්තිය සඳහා විභාව, අනුභාව සහ ……………………………………… භාව සංයෝග වන බව කියැවේ.

**28.** ප්‍රංශයේ බැලේ නර්තන කලාව ව්‍යාප්ත කිරීමට පුරෝගාමී වූයේ ……………………………… රජු ය.

**29.** **මල් මඩුව** නම් වීදි සැරසිල්ල සකස් කරනු ලබන්නේ ……………………………… ශාන්තිකර්මයේ දී ය.

**30.** හඬ සුසර කර ගැනීම සඳහා **සවරම** යොදා ගනු ලබන්නේ ………………………… නම් වාද්‍ය භාණ්ඩයට ය.

**31.** ධි න | ධි ධි න | ති න | ධි ධි න
x 2 0 3

යන හින්දුස්ථානි තාලය, දේශීය තාල පද්ධතියෙහි……………………………… දෙතිතට සමාන ය.

**32.** පරන්, ටුම්රි සහ තරානා යන නර්තන අංග ……………………… නර්තන සම්ප්‍රදායට අයත් ය.

**33.** නාට්‍ය කලාව ප්‍රධාන වශයෙන් ………………………… සහ නාට්‍ය ධර්මී යනුවෙන් කොටස් දෙකකට බෙදිය හැකි ය.

**34.** මහනුවර යුගයේ දී වන්නම් සහ ප්‍රශස්ති, ගායනා වශයෙන් ඉදිරිපත් වූයේ දළදා මාළිගා භූමියේ පිහිටි ……………………………………… දී ය.

**35.** **සිව්ලිය** නම් වූ විශේෂිත හිස් පළඳනාව පූජාවට බඳුන්වන්නේ ………………………… ශාන්තිකර්මයේ දී ය.

- අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** 'ගම්බිර කාලිංග නුවර නිරිඳුගෙ රජ වාසලයට' යන කවියෙන් නිරූපිත චරිතය සහ ගැමි නාටකය කුමක් ද?

(i) චරිතය : ..............................................

(ii) ගැමි නාටකය :..............................................

**37.** මුල් මාත්‍රය අන්තර්ගත නර්තන සම්ප්‍රදාය සහ එහි තාල රූපය නම් කරන්න.

(i) නර්තන සම්ප්‍රදාය : ..............................................

(ii) තාල රූපය :..............................................

**38.** "ලකළ පුළුලුකුළ බඳ මිණි මෙවුල් ලා - සමග රන් සළඹ රැව් දී වෙවුල් ලා"
මෙම කවි පදය අයත් සංදේශ කාව්‍යය හා එය රචනා වූ යුගය ලියා දක්වන්න.

(i) සංදේශය : ..............................................

(ii) යුගය :..............................................

**39.** **නට් ක්‍රැකර්** යන බැලේ නිර්මාණයෙහි නර්තන රචකයා සහ සංගීත නිර්මාණ ශිල්පියා නම් කරන්න.

(i) නර්තන රචකයා: ..............................................

(ii) සංගීත නිර්මාණ ශිල්පියා :..............................................

**40.** ස්ථිතික චලන හා සංචාරී චලන යනු මොනවා ද?

(i) ස්ථිතික චලන: ..............................................

(ii) සංචාරී චලන :..............................................

**41.** පහත **A** හා **B** රූපවලින් දැක්වෙන සන්නියකුම ශාන්තිකර්මයේ නිරූපිත චරිත නම් කරන්න.

A



B



(i) **A** රූපය: ..............................................

(ii) **B** රූපය :..............................................

**42.** "බුද්ධං සරණේ සිරස දරා ගෙන..." යන කවි පදය මාත්‍රා තුනේ තාල රූපය අනුව ගැයීමේ දී ඊට අයත් සඳැස් මත් සහ ගී මත් ගණන සඳහන් කරන්න.

(i) සඳැස් මත් : ..............................................

(ii) ගී මත් :..............................................



EXAMMOOD.LK

**43.** **චෝලි** සහ **ඔට්ටියානම්** යන රංග වස්ත්‍රාභරණ භාවිත නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) චෝලි: ...........................................................................

(ii) ඔට්ටියානම් :.................................................................

**44.** කිරි මඩුව ශාන්තිකර්මයේ දී පුද ලබන ප්‍රධාන දෙවියා සහ එය පැවැත්වීමේ ප්‍රධාන අරමුණ සඳහන් කරන්න.

(i) ප්‍රධාන දෙවියා: .......................................................................


(ii) ප්‍රධාන අරමුණ :......................................................................


**45.** යූ. වී. ලයිට් (Ultra Violet Lamp) මගින් විහිදුවන ආලෝකයට ප්‍රතිචාර දක්වන වර්ණය හා ආලෝකයේ තීව්‍රතාව පාලනය කරන උපකරණය දක්වන්න.

(i) වර්ණය: ...........................................................................

(ii) උපකරණය :.......................................................................

● අංක **46** සිට **47** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.

A


B


C


D


**46.** ඉහත **A** සහ **B** රූපවලින් දක්වා ඇති රංග වස්ත්‍රාභරණ නම් කරන්න.

(i) **A** රූපය :.......................................................................

(ii) **B** රූපය :.......................................................................

**47.** ඉහත **C** සහ **D** රූපවලින් නිරූපිත නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) **C** රූපය :.......................................................................

(ii) **D** රූපය :.......................................................................

**48.** "රේණු දොඩම් දෙහි ඇඹුලුයි ගාන්නේ

දෝණු හරින ලෙස වරලස මුදන්නේ"

මෙම කවිය අයත්වන පෙළපාළි අංගය සහ එමගින් නිරූපණය වන චරිතය ලියා දක්වන්න.

(i) පෙළපාළි අංගය :...............................................................

(ii) චරිතය :...........................................................................

**49.** ලක්දිව, බලියාගය බෞද්ධ මුහුණුවරකින් ස්ථාපිත කරලීමට පුරෝගාමී වූ හිමිවරුන් **දෙදෙනකු** සඳහන් කරන්න.

(i) ...........................................................................

(ii) ...........................................................................

**50.** සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය සහ එය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය සඳහන් කරන්න.

(i) කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ වූ වර්ෂය: .........................

(ii) ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට ස්ථාපිත වූ වර්ෂය :...................

* * *

EXAMMOOD.LK

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් කවි පදය මහ තනි තිතට අනුව ප්‍රස්තාර කරන්න.

"ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට ඉරු දෙවි අධිපති වන්නේ"

(ii) සුරපති වන්නමේ අඩව්ව හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මේඝ වන්නමේ අඩව්ව හෝ නිවැරදි තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.

(iii) මංගලම් නර්තනයට අදාළ කස්තිරම තුන්සුළු දෙමහ පස්තිතට අනුව ප්‍රස්තාර කරන්න.

**2.** දේශීය නර්තන කලාව විකාශනය වීමේ දී රාජ්‍ය අනුග්‍රහය මෙන් ම භාරතීය සංස්කෘතික ලක්ෂණ ද බලපා ඇති බව මූලාශ්‍රය මගින් හෙළි වේ.

(i) ගම්පළ යුගයේ දී නර්තන කලාවට බලපෑ භාරතීය ආභාසය කෙබඳු දැයි සාධක **දෙකක්** මගින් පෙන්වා දෙන්න.

(ii) දඹදෙණි හා කුරුණෑගල යුගවල භාවිත වාද්‍ය භාණ්ඩ පිළිබඳ තොරතුරු සාහිත්‍යය මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් දක්වන්න.

(iii) 1970 දශකයේ නර්තන කලා අධ්‍යාපනයේ ප්‍රවර්ධනයට ලැබුණු රාජ්‍ය අනුග්‍රහය සාධක **හතරක්** ඇසුරෙන් විමසන්න.

## II කොටස

**3.** දේශීය ශාන්තිකර්මවල ඒ ඒ නර්තන සම්ප්‍රදායන්ට ආවේණික ලක්ෂණ මෙන් ම සමාන ලක්ෂණ ද විද්‍යමාන වේ.

(i) 'වලියක් මංගල්‍යය' හා බැඳුණු චාරිත්‍ර විධි **දෙකක්** නම් කර, එහි අනන්‍යතා ලක්ෂණ පිළිබඳ සාකච්ඡා කරන්න.

(ii) 'රටයකුම' ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කර, එහි 'දරු නැළවිල්ල' පෙළපාළි අංගය පිළිබඳ විග්‍රහයක් කරන්න.

(iii) 'කිරි මඩුව' ශාන්තිකර්මයෙහි ආවේණික ලක්ෂණ, එහි නාට්‍යමය පෙළපාළි **දෙකක්** ඇසුරෙන් ඇගයීමක් කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

4. සිංහල ශාන්තිකර්මවල අභිමතාර්ථ ඉටුකර ගැනීමේ දී උපත් කතා, නාට්‍යමය පෙළපාළි හා සැරසිලි ක්‍රම උපයෝගී කොට ගෙන තිබේ.

(i) 'වෛරය නිසා ඇති වන සමාජ ව්‍යසනයන්' පිළිබඳ සන්නියකුම ශාන්තිකර්මයේ උපත් කතාවක් ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

(ii) 'ඌරා යක්කමේ' හෝ 'පොත්කඩේ යක්කමේ' හෝ චරිත නිරූපණය විචාරයට ලක් කරන්න.

(iii) බලි ශාන්තිකර්මයෙහි දක්නට ලැබෙන ඇඹුම් ශිල්පක්‍රම, වර්ණ ගැන්වීම්, සැරසිලි හා අමුද්‍රව්‍යවල සුවිශේෂත්වය පිළිබඳ විග්‍රහයක් කරන්න.

5. ගැමි නැටුම් හා ගැමි නාටකවලින් ආගමික, සමාජ හා සංස්කෘතික ජීවන රටාව පිළිබිඹු වේ.

(i) ගැමි නැටුම්වලට අදාළ ගායනා **දෙකක්** මගින් ගැමි ඇදහිලි හා විශ්වාස පිළිබඳ පැහැදිලි කරන්න.

(ii) 'ගැමි නැටුම්වලින් සමාජ සහයෝගිතාව මෙන් ම සාරධර්ම සංවර්ධනය කෙරේ.' විමසන්න.

(iii) 'ජස හා මුදලි චරිත නිරූපණවලින් තත්කාලීන සමාජ අත්දැකීම් විවරණය කරයි.' මෙම ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| පරන් | XIV ලුවී රජ | පටාචාරා |
| වර්ණම් | මහා පීටර් රජ | නට් ක්රැකර් |
| ධුම්රි | III හෙන්රි රජ | නිදි කුමරිය |
| තරානා | VIII හෙන්රි රජ | බැරිසිල් |

(i) (අ) කොටස - භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංගය තෝරා එහි සුවිශේෂ ලක්ෂණ විස්තර කරන්න.

(ii) (ආ) කොටස - රුසියාවේ බැලේ රංග කලාවට අනුග්‍රහය ලබා දුන් රජ නම් කර, ඔහුගෙන් සිදු වූ සේවය අගයන්න.

(iii) (ඉ) කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි කතා පුවත, සංගීත නිර්මාණය සහ රංග වින්‍යාසය පිළිබඳ විමසීමක් කරන්න.

7. ප්‍රාසංගික නර්තනයේ ප්‍රගමනයට පෙරදිග හා අපරදිග නර්තන ප්‍රවණතා බෙහෙවින් බලපා ඇත.

(i) නව නර්තනය බිහි වීම සඳහා අද්‍යතන සමාජ රුචිකත්වය බලපා අති ආකාරය ඉහත පාඨය ඇසුරෙන් විමසන්න.

(ii) දේශීය නව නර්තන ප්‍රවණතා කෙරෙහි ජන සන්නිවේදන මාධ්‍ය බලපා ඇති අයුරු සාකච්ඡා කරන්න.

(iii) ප්‍රාසංගික නර්තන නිර්මාණකරණය සඳහා සංගීතය, රංග වස්ත්‍රාභරණ, අංග රචනය සහ ආලෝකකරණය යොදා ගැනීමේ දී ඖචිත්‍ය බව වැදගත් වේ. ඔබගේ අදහස් දක්වන්න.

8. ආනුෂංගික කලා භාවිතයේ සුවිශේෂත්වය නිසා අද්‍යතන ප්‍රසංගික නර්තන නිර්මාණකරණයට ද ප්‍රමුඛත්වයක් හිමි වී ඇත.

(i) චිත්‍ර කලාවේ මූලිකාංග, නර්තන කලාව හා බැඳෙන ආකාරය උදාහරණ සහිත ව දක්වන්න.

(ii) චරිතාංග අංගරචනය යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

(iii) රංග භූමිය හා නූතන වේදිකාව අර්ථ කථනය කොට පින්තූර රාමු වේදිකාවේ සුවිශේෂ ලක්ෂණ විග්‍රහ කරන්න.

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK

0174

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07/ 0830 - 1030

නර්තනය (භරත) I
நாட்டியம் (பரதம்) I
Dancing (Baratha) I

53 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**
- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** "අම්මෙමෙයේ අප්පා ඔප්පිලා මනියේ..." යන පද්‍යයෙන් ආමන්ත්‍රණය කරනුයේ,
(1) ගණ දෙවියන් ය. (2) ශිව දෙවියන් ය. (3) මුරුගන් දෙවියන් ය.
(4) විෂ්ණු දෙවියන් ය. (5) වයිරවර් දෙවියන් ය.

**2.** සාත්වික භාවයේ 'වයිවරණය' යනු,
(1) හඬ වෙනස්වීම ය. (2) වෙව්ලීම ය. (3) හිරිගඩු පිපීම ය.
(4) කඳුලු ගැලීම ය. (5) ශරීර වර්ණය වෙනස්වීම ය.

**3.** ජති හෝ ගීත විෂමග්‍රහයෙහි පිහිටා ආරම්භ කිරීමට යොදන නාමය වනුයේ,
(1) අතීත කාලය වේ. (2) කාක පාදය වේ.
(3) සමග්‍රහ වේ. (4) ප්ලුත වේ.
(5) අනාගත කාලය වේ.

**4.** අභිනය යන්නට කණ්නාඩිය යනුවෙන් අර්ථ දැක්වෙන ග්‍රන්ථය වනුයේ,
(1) නාට්‍ය ශාස්ත්‍රය ය. (2) අභිනය සාර සම්පුටම් ය.
(3) අභිනය දර්පණය ය. (4) පංචමරපු ය.
(5) අභිනය නව නීතම් ය.

**5.** 'පුරුකු' නම් සැහැල්ලු ලීයෙන් සෑදූ ආභරණ පැළඳ නර්තනයේ නියැළෙන සම්ප්‍රදාය වනුයේ,
(1) භරත නාට්‍යම් ය. (2) මෝහිනී ආට්ටම් ය.
(3) කතකලි ය. (4) කුච්චිපුඩි ය.
(5) ඔඩිසි ය.

**6.** නාට්‍ය ශාස්ත්‍රයේ කරණ 108 අර්ථ දැක්වෙන පරිච්ඡේදය වනුයේ,
(1) සිව් වන පරිච්ඡේදය ය. (2) දස වන පරිච්ඡේදය ය.
(3) අට වන පරිච්ඡේදය ය. (4) පස් වන පරිච්ඡේදය ය.
(5) දෙවන පරිච්ඡේදය ය.

**7.** නිශ්චිත ස්ථානයකට ප්‍රේමවන්තයාගේ නොපැමිණීම නිසා රැවටීම හා ලැජ්ජාවට පත් වන අෂ්ටවිද නායිකාවන්ගෙන් කෙනෙකු වන්නේ,
(1) ස්වාධීන පතිකා නායිකා ය. (2) විප්‍රලප්තා නායිකා ය. (3) අභිසාරිකා නායිකා ය.
(4) ඛණ්ඩිතා නායිකා ය. (5) විරහෝත්ඛණ්ඩිතා නායිකා ය.

**8.** විභාව තුළින් මතුවන ඵලය
(1) ස්ථායි භාව වේ. (2) සංචාරී භාව වේ. (3) සාත්වික භාව වේ.
(4) අනුභාව වේ. (5) විභාව වේ.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** නර්තන විධි එකොළසකින් තුඩි නම් නර්තන විධිය රඟ දැක් වූ දෙවියා වනුයේ,
(1) තිරුමාල් දෙවියන් ය. (2) තිරුමහල් දෙවියන් ය.
(3) මුරුගන් දෙවියන් ය. (4) ශිව දෙවියන් ය.
(5) කාලි දෙවඟන ය.

**10.** පල්ලව යුගයට අයත් කෝවිල්වල විසූ දේවාදාසීන් 'සේයිලෙයාර්' යනුවෙන් හැඳින්වූ භක්ති සාහිත්‍ය
(1) තේවාරම් ය. (2) තිරුමන්දිරම් ය. (3) පෙරිය පුරාණම් ය.
(4) ආල්වාර් පාසුරන්ගල් ය. (5) තිරුවාලංකාට්ටු මූත්ත තිරුප්පදිහම් ය.

**11.** උඩරට ප්‍රදේශයට ආවේණික කුත්තු ශෛලී පිළිබඳ පමණක් සඳහන් වරණය තෝරන්න.
(1) වසන්තම් කුත්තු හා වාසාප්පු කුත්තු (2) වඩමෝඩි කුත්තු හා තෙන්මෝඩි කුත්තු
(3) අරුච්චුනන් තපසු සහ කාමන් කුත්තු (4) වඩපාංගු කුත්තු සහ තෙන්පාංගු කුත්තු
(5) මගිඩික් කුත්තු සහ පරෙරමේල කුත්තු

**12.** පන්තේරු නම් නර්තන අංගය අයත් ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදාය කුමක් ද?
(1) සබරගමුව සම්ප්‍රදාය (2) පහතරට සම්ප්‍රදාය (3) කෝලම් සම්ප්‍රදාය
(4) සොකරි සම්ප්‍රදාය (5) උඩරට සම්ප්‍රදාය

**13.** "උදරා" නම් චතුර්විධ නාටකයෙහි රඟ දැක් වූ ස්ත්‍රිය, රගුනාදනායකර් විසින් හඳුන්වා දෙනුයේ,
(1) ඌර්වෂීය ලෙස ය. (2) චන්ද්‍රලේඛා ලෙස ය.
(3) රම්පා ලෙස ය. (4) රූපවතී ලෙස ය.
(5) කෝමලවල්ලී ලෙස ය.

**14.** අෂ්ටපදී නම් නර්තන අංග ගීත රචිත භාෂා මාධ්‍යය කුමක් ද?
(1) දෙමළ (2) වඩමොලි (3) තෙලිඟු
(4) කණ්නඩ (5) හින්දි

**15.** සංකීර්ණ ජතී ධ්‍රැව තාලය, තිශ්‍ර ජතියට හැරවීමේ දී ලබා ගත හැකි මාත්‍රා සංඛ්‍යාව
(1) 14 කි. (2) 17 කි. (3) 23 කි. (4) 29 කි. (5) 87 කි.

**16.** වීණාව සෑදීම සඳහා භාවිතයට ගනු ලබන දැව වර්ග වනුයේ
(1) අඹ, කොහොඹ, තේක්ක ය. (2) කඳු කොහොඹ, නුග, බෝ ය.
(3) තිරුවාතී, කොහොඹ, දං ය. (4) කොස්, කළුවර, ආඩුම්බර ය.
(5) ගන්සූරිය, දං, දිවුල් ය.

**17.** 'කෝෂයාත්‍රා' නම් ග්‍රන්ථයෙහි සඳහන් ශාස්ත්‍රීය නැටුම,
(1) භරත නාට්‍යම් ය. (2) මෝහිණී ආට්ටම් ය. (3) කුච්චිපුඩි ය.
(4) කතකලි ය. (5) ඔඩිසි ය.

**18.** රජ මාලිගාව, කඳු, ගස්, යනාදිය ප්‍රාසංගික නිරූපණය කිරීමේ ආහාර්ය අභින විශේෂය වනුයේ
(1) අලංකාරය ය. (2) අංග රචනා ය. (3) පූෂ්ටම් ය. (4) සංජීවම් ය. (5) අභිසාරී ය.

**19.** කතකලි අංග රචනයේ දී කොළ පැහැයෙන් මුහුණ වර්ණ ගන්වනුයේ,
(1) නපුරු චරිත ය. (2) අර්ධ මිනිස් චරිත හා අර්ධ වානර දේව ය.
(3) වනචාරී චරිත ය. (4) ධාර්මික චරිත ය.
(5) ආදිවාසී චරිත ය.

**20.** පූර්වාංගය හා උත්තරාංගය යන ආකෘති අයත් නර්තන අංගය
(1) පදම් ය. (2) කීර්තනම් ය. (3) පද වර්ණම් ය.
(4) තිල්ලානා ය. (5) ශබ්දම් ය.

**21.** ශ්‍රී ලංකාවේ පළමුවරට ලලිත කලාවේදී උපාධිය පිරිනැමූ විශ්වවිද්‍යාලය
(1) යාපන විශ්වවිද්‍යාලයේ රාමනාදන් ඇකඩමිය ය.
(2) රුහුණු විශ්වවිද්‍යාලය ය.
(3) ස්වාමි විපුලානන්ද ලලිත කලායතනය නැගෙනහිර විශ්වවිද්‍යාලය ය.
(4) රජරට විශ්ව විද්‍යාලය ය.
(5) කොළඹ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ය.

EXAMMOOD.LK EXAMMOOD.LK

**22.** තක දිකු තදිංගිනතොම්, තක තදිංගිනතොම්, තදිංගිනතොම්, ගිනතොම් යන අවසාන තීර්මානට අන්තර්ගත ජති වර්ගය වනුයේ,

(1) ඩමරුක ජති ය. (2) කෝපුච්ච ජති ය.
(3) ශ්‍රෝතෝවක ජති ය. (4) විෂම ජති ය.
(5) මෘදංග ජති ය.

**23.** ශාකුන්තලය නාටකයේ ශෝක රසයේ ආලම්බන විභවයට අදාළ නිවැරදි වරණය තෝරන්න.

(1) වෙව්ලීම (2) ක්ලාන්තය (3) කඳුලු ගැලීම
(4) හෘද ස්පන්දනය වැඩිවීම (5) ශාප කිරීම

**24.** ගැමි ජන සමාජය නිරූපණය සඳහා යොදාගත හැකි ශබ්ද උපක්‍රමය වනුයේ,

(1) කෝලාහල හඬ සහ බල්ලන් බුරන ශබ්දය ය.
(2) කාර් රථ, බස් රථ හා ත්‍රීවිල් යන වාහන ධාවනයේ දී නැගෙන ශබ්ද ය.
(3) වෙළෙඳ පොළක ශබ්දය හා ධාවනය වන දුම්රියක ශබ්දය ය.
(4) තිරික්කල ශබ්දය හා නෙලුම් ඕසය ය.
(5) බකමූණු හා කුරුල්ලන්ගේ කිචි බිචි හඬ ය.

**25.** දෑතට වර්ණවත් ලේන්සු ගනිමින් සිදු කරන ජන නැටුමක් වන්නේ,

(1) කෝලාට්ටම් ය. (2) බොම්මලාට්ටම් ය. (3) කාවඩි ය.
(4) මයිලාට්ටම් ය. (5) ඔයිලාට්ටම් ය.

**26.** ලඝු මාත්‍රයක අගය නිර්ණය කරනුයේ,

(1) ක්‍රම ය. (2) ජාති ය. (3) ක්‍රියා ය. (4) මාර්ග ය. (5) කාලය ය.

**27.** අතීතයේ දී වර්ෂාපතනය අපේක්ෂාවෙන් සිදු කරන ලද කුත්තු විශේෂය,

(1) මහිඩික් කුත්තු ය. (2) වඩමෝඩි කුත්තු ය. (3) තෙන්මෝඩි කුත්තු ය.
(4) වසන්තම් කුත්තු ය. (5) කාමන් කුත්තු ය.

**28.** නටරාජා ප්‍රතිමාවෙහි නිරූපිත අංග ලක්ෂණ අතෙන් අධිශක්තිය නිරූපණය කරනුයේ මින් කුමකින් ද?

(1) මඳහාසය (2) අඩහඳ (3) ගංගා නදිය
(4) තෙවෙනි ඇස (5) මුවා

**29.** ස්ථායි භාවයේ විශ්මය වනුයේ,

(1) වෛරය ය. (2) කෝපය ය. (3) උත්සාහය ය. (4) ශාන්ත ය. (5) පුදුමය ය.

**30.** 'සඳුර්තන්ඩි ප්‍රකාශිකා' යන ග්‍රන්ථයෙහි මේල හා රාග 72 පිළිබඳ සෘජු අර්ථ ප්‍රකාශනයක යෙදුණේ,

(1) ත්‍යාගරාජා ස්වාමි ය. (2) වේංගඩමඛි ය. (3) පරදර් ය.
(4) නන්දිකේශ්වර ය. (5) තණ්ඩු මුනිවර ය.

**31.** තන්ජාවූර් සහෝදරයින්ගේ පියා වනුයේ

(1) තන්ජාවූර් සුබ්බරයා නට්ටුවනාර් ය. (2) මුතු තාණ්ඩවර් ය.
(3) අරුණාචල නට්ටුවනාර් ය. (4) ගංගෙමුත්තු නට්ටුවනාර් ය.
(5) පන්දනෙ නල්ලූර් මීනාක්ෂි සුන්දරම් පිල්ලෙ ය.

**32.** තුති ශෛලියේ දී අවස්ථානුකූලව අත්‍ය, වේශයකට පරිවර්තනය විය හැකි අතිදක්ෂ නිරූපණ ශිල්පිණිය වනුයේ,

(1) තුති ය. (2) සගි ය. (3) තාත්රේයි ය. (4) ඉලිංගිනී ය. (5) සේඩී ය.

**33.** එක් මුහුණතින් යුතු, සමින් බඳින ලද වාද්‍ය භාණ්ඩය කුමක් ද?

(1) තප්පු (2) තවිල් (3) මෘදංගය (4) මද්දලය (5) උරුමි

**34.** පළමුවන 'තත් තෙයි තාම් - දිත් තෙයි තාම්' යන අඩව්වෙහි අවසානයේ භාවිත උත්පලවන පාද භේදය වනුයේ,

(1) කුට්ටනම් ය. (2) කත්තරි ය. (3) මෝට්තම් ය.
(4) අලගම් ය. (5) අශ්වෝද්පලවනම් ය.

EXAMMOOD.LK
EXAMMOOD.LK

[ හතරවැනි පිටුව බලන්න.

**35.** "එඩුත්ත පොට් පාදමුම් කානප් පෙට්රාල් ...... " යන අප්පර් පද්‍යයෙන් නිරූපිත දේව රූපය
(1) අර්ධනාරීශ්වර ය. (2) සෝමස්කන්ධ ය.
(3) ලිංග්කෝට්පවර් ය. (4) පරමේශ්වර ය.
(5) නඩරාජා ය.

**36.** ;;, ත, දිං, ගි, න, තොමිත,/ තිං, ගි, න, තොමිත/, තිං, ගි, න, තොම් // යන තාලාංගයේ අන්තර්ගත විය යුතු තතිංගිනතොම් පිහිටා ඇති ජාතිය කුමක් ද?
(1) සංකීර්ණ ය. (2) තිශ්‍ර ය. (3) ඛණ්ඩ ය. (4) චතුරස්‍ර ය. (5) මිශ්‍ර ය.

**37.** වචනයෙන් හා ක්‍රියාවෙන් උපහාසය නිරූපණය කර, කථාව හා සම්බන්ධය ඇති කරන 'කෝනංගි' නම් පාත්‍ර විශේෂය අයත් නර්තන වර්ගය වනුයේ,
(1) යක්ෂගාන ය. (2) කුට්ට්‍රාල කුරවංජි ය. (3) ඔඩිසි ය.
(4) මණිපුරි ය. (5) පාහවද මේලම් ය.

**38.** ධීර ශාන්ත යන නායක භේදයට උදාහරණය වනුයේ,
(1) බුදුන් වහන්සේ ය. (2) රාවණා ය. (3) ශ්‍රී ක්‍රිෂ්ණ දෙවි ය.
(4) කෝවලන් ය. (5) අර්ජුන ය.

**39.** තලෛකෝලියර් නැටුම් ගුරුවරු විසූ බවට "අරංගියල් මගලිර්ක්කු ආඩල් වගුක්කුම් තලෛක්කෝල් පෙන්ඩිර්" පද්‍ය මගින් අර්ථ ගැන්වෙන ග්‍රන්ථය වන්නේ,
(1) සීලප්පදිකාරම් ය. (2) කුනනූල් ය. (3) සයන්දම් ය.
(4) මණිමේකලා ය. (5) පෙරුංකදෛ ය.

**40.** 'තකදිමි තකිට' ජාතියේ අයත් තතිංකිත තොම් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) තතිංකිනතොම් (2) තදිං, ගිනතොම් (3) ත, දිං, ගිනතොම්
(4) ත, දිං, ගි, න, තොම් (5) තදිං, ගි, න, තොම්

- ප්‍රශ්න අංක **41** සිට **45** දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් වගුව ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.

| රස | දේව | විරුද්ධ රස | වර්ණය | ස්ථායි භාව |
|---|---|---|---|---|
| ශෘංගාර | විශ්ණු | බීභත්ස්‍ය | කොළ | රති |
| කරුණා | A | හාස්‍ය | අළු | ශෝක |
| B | රුද්‍ර | අද්භූත | රතු | ක්‍රෝධ |
| වීර | ඉන්ද්‍ර | C | ලා රතු | උත්සාහ |
| බීභත්ස්‍ය | ශිව | ශෘංගාර | D | ජුගුප්සා |
| අද්භූත | බ්‍රහ්ම | රෞද්‍ර | කහ | E |

**41.** A වලින් නිරූපිත දෙවියන් වනුයේ,
(1) බුදුන් ය. (2) මාර ය. (3) මහාකාලන් ය. (4) ඉන්ද්‍ර ය. (5) විශ්ණු ය.

**42.** B වලින් නිරූපණය වන රසය වනුයේ,
(1) ශාන්ත ය. (2) හාස්‍ය ය. (3) භයානක ය. (4) රෞද්‍ර ය. (5) කරුණා ය.

**43.** C වලින් නිරූපිත විරුද්ධ රසය වනුයේ,
(1) කරුණා ය. (2) හාස්‍ය ය. (3) භයානක ය. (4) අද්භූත ය. (5) ශෘංගාර ය.


**44.** D වලින් නිරූපිත වර්ණය වනුයේ,
(1) සුදු ය. (2) නිල් ය. (3) කොළ ය. (4) කළු ය. (5) කහ ය.

**45.** E වලින් නිරූපිත ස්ථායි භාවය වනුයේ,
(1) භය ය. (2) හාස ය. (3) ශෝක ය. (4) විශ්මය ය. (5) ක්‍රෝධ ය.



EXAMMOOD.LK

**46.** මෙම රූපයේ දක්වා ඇති වාද්‍ය භාණ්ඩය................. වේ.




(1) මද්දලය
(2) මෘදංගය
(3) තප්පු
(4) තවිල්
(5) පරෛ

**47.** මෙම රූපයේ දක්වා ඇති නර්තන ශිල්පියා................. වේ,



(1) ගීතාංජලී වී.කේ. නල්ලයියා
(2) බ්‍රහ්ම ශ්‍රී වීරමනී අයියර්
(3) න. රාසරත්නම්
(4) ක. තොම්මක්කුට්ටි
(5) ම. කයිලාය පිල්ලෙ

**48.** මෙම රූපයේ දක්වා ඇති භරත නර්තන ආභරණ................. වේ,




(1) රාක්කොඩි, කුංජම්
(2) ජිමික්කි, කාදු මාට්ටි
(3) නෙත්තිචරි, උච්චිචරි
(4) පුලාක්කු, නත්තු
(5) චන්ද්‍ර පිරෛ, සූරිය පිරෛ

**49.** මෙම රූපයෙන් නිරූපිත ශාස්ත්‍රීය නර්තන සම්ප්‍රදාය................. වේ.



(1) කතකලි
(2) කතක්
(3) මණිපුරි
(4) කුච්චිපුඩි
(5) සබරගමු නැටුම්

**50.** මෙම රූපයෙන් දැක්වෙන නර්තන අංගය වනුයේ ................. වේ.



(1) මානාට්ටම්
(2) පුලියාට්ටම්
(3) මයිලාට්ටම්
(4) බොම්මල් ආට්ටම්
(5) කුදිරෛ ආට්ටම්

* * *

EXAMMOOD.LK

AL/2019/53-S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

නර්තනය (භරත) II
நாட்டியம் (பரதம்) II
Dancing (Baratha) II

53 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඔබ උගත් පද වර්ණම් අංගයක තාලය සහ රාගය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ඔබ උගත් පද වර්ණම් ගීතයක රචකයා හා නර්තන නිර්මාපකයා සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(iii) එහි පළමුවන චරණම් ස්වර කෝර්වෛ තාල අංග සංකේත සමග ලියා දක්වන්න. (ලකුණු 06යි.)

(iv) එහි පළමුවන තීර්මාණම් තාල අංග සංකේත සමග ලියා දක්වන්න. (ලකුණු 10යි.)

**2.** (i) කුච්චිපුඩි නර්තනයේ ප්‍රභවය සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(ii) කුච්චිපුඩි නර්තනයේ වේශභූෂණ ක්‍රම ශිල්ප සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(iii) කුච්චිපුඩි නර්තන ශිල්පීන් දෙදෙනෙකු නම් කර එහි භාවිත වාද්‍ය භාණ්ඩ ලියා දක්වන්න. (ලකුණු 04යි.)

(iv) කුච්චිපුඩි නෘත්‍ය නාටක පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05යි.)

(v) කුච්චිපුඩි නර්තනයේ සංවර්ධනය පිළිබඳ සවිස්තරාත්මකව දක්වන්න. (ලකුණු 05යි.)

**3.** (i) තාල දස ප්‍රාණ දක්වන්න. (ලකුණු 02යි.)

(ii) ජති යන්න අර්ථ දක්වන්න. (ලකුණු 03යි.)

(iii) ජති වර්ග සඳහන් කරන්න. (ලකුණු 03යි.)

(iv) ජති වර්ග සවිස්තරාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 12යි.)

## II කොටස

**4.** (i) සප්ත තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) සප්ත තාලයේ තාලාංග සංකේතාත්මකව දක්වන්න. (ලකුණු 03යි.)

(iii) සප්ත තාල 35 සැකැස්ම නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(iv) සප්ත තාල 35, 175 ක සැකැස්ම නිදර්ශනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**5.** (i) සංගම් යුගයේ නර්තන ශිල්පීන් නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) එම යුගයට අයත් කුරවෛ, තුනංගෛ, වෙරියාට්ටු යන අංග පිළිබඳ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

(iii) සංගම් යුගයට අයත් නර්තන, ජන ජීවන පැවැත්ම හා බද්ධ වූ ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

[ දෙවැනි පිටුව බලන්න.

**6.** පහත සඳහන් අංග සඳහා කෙටි සටහන් ලියන්න.

(i) මගිඩික්කුත්තු

(ii) කලා ක්ෂේත්‍රා

(iii) අභිනය දර්පණය

(iv) දූතයාගේ ගති ලක්ෂණ

(ලකුණු 05 × 4 = 20යි.)

**7.** කලෙලෙව්වෙල්වන් ඒරම්බු සුප්පයියාගේ ජීවන තොරතුරු සඳහන් කර එතුමා කලාවට සිදු කළ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**8.** "ග්‍රාමීය කලාව ගැමි ජනයාගේ ආගමික සහ සමාජීය ජීවන රටාව සමග ඒකාබද්ධ වී ඇත" යන ප්‍රකාශයෙහි වලංගුතාවය පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

* * *

EXAMMOOD.LK
EXAMMOOD.LK